2

# අල්ලාහ් නැමදුමට සුදුස්සා ය

අල්ලාහ් "කුන්" (ඇතිවනු) යන වචනයෙන් මෙලොව මැව්වේ ය. අනතුරු ව අල්ලාහ් මිනිසුන් හා ජින්වරුන් මැව්වේ ඔහු නැමදුම සඳහා ය.

මිනිසුන්ගේ ස්වභාවය දැන සිටි මලාඉකාවරු "අපරාධකොට ලේ හැලීමට සලස්වන්නන් ද ඔබ මවන්නේ? අපි ඔබට ප්‍රශංසා කරන අය වෙමු" යැයි අල්ලාහ් සමඟ පැවැත් වූ දීර්ඝ සාකච්ඡාවක් සූරතුල් බකරාවේ 30වන වැකියෙන් ඇරඹෙයි.

මිනිසා මැවූ අල්ලාහ් තමාට පමණක් නැමදිය යුතු, යැයි මිනිසාට අණ කළේ ය.

"මිනිසුනි, ඔබ, ඔබ හා ඔබට කලින් සිටි අය මැවූ ඔබගේ ම දෙවියන් නමදින්න. එවිට ඔබ දේවභක්තිය හා තක්වා පාරිශුද්ධතාව ඇති අයකු වන්නේ ය." (2 : 21)

එහෙත් මිනිසා මෙය අමතක කොට තම සීමිත දැනුමට අදාළ පරිදි අල්ලාහ් මැවූ මැවීම්වල ඇති විශේෂ ලක්ෂණ දෙස බලා ඒවා දෙවියන් යැයි විශ්වාස කොට නමදින්නට පෙළඹෙන්නේ ය.



මෙසේ අල්ලාහ් හැර මනඃකල්පිත තවත් දෙවියකු නැමදීම "ෂිර්ක්" වේ. අල්ලාහ් මෙම පාපයට කිසිවෙකුට සමාව නොදෙන්නේ ය. එනමුත් ෂිර්ක් වූ දේ කිරීම පුරාණයේ පටන් ම සිදුවෙමින් පවතී. එය මුළුමනින් ම වැරදි කටයුත්තකි.

"නැමදුම සඳහා සුදුසු එකම දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙක් නොවේ. මහා රජය ඔහු ය. ඉතා පාරිශුද්ධයා ඔහුය. ශාන්තිය ලබා දෙන්නාත්, රැකවල් දෙන්නාත්, සුරකින්නාත්, (සියල්ල ම) අභිබවන්නාත්, පාලනය කරන්නාත්, ප්‍රශංසාවල හිමිකරුත් ඔහු ය. ඔවුන් සම කරන සියල්ලට වඩා ඔහු ඉතා පාරිශුද්ධ ය." (59 : 23)

"අහස හා පොළොව යන්නෙ හි අල්ලාහ් හැර වෙනත් දෙවියන් සිටියේ නම් සැබවින් ම ඒ දෙක විනාශ වී යන්නට ඇත." (21 : 22) යැයි අල් කුර්ආනය දැනුම්වත් කරයි.

නැමදුමට සුදුස්සා අල්ලාහ් පමණි. ඔහු ඒකයා ය. කිසිවකුගේ අවශ්‍යතා නැති අයකි. ඔහුට සමාන ව කිසිවක් ගෙන ආ නොහැක. විශ්වය හා එහි අන්තර්ගත පණ ඇති හා නැති සියල්ල මැව්වේ ඔහු ය. ඔහුට නොදැනුවත් ව ගසක කොළයක් හෝ වැටෙන්නේ නැත. රහස්‍ය හා රහස්‍ය නොවන සියල්ල දන්නේ ඔහු ය. ඔහු දයාවන්තයා ය; අසමසම ය; අපරිමිත කරුණාවන්තයා ය; ඔහු සියල්ල ඉක්මවූ දැනුම් ඇත්තෙකි. එනිසා අප නැමදිය යුත්තේ ඔහුට ය.

"නබිවරයාණෙනි, පවසන්න. අල්ලාහ් ඒකයා ය. ඔහු අවශ්‍යතා කිසිවක් නැති අයකි. ඔහු කිසිවකු විසින් වැදුවේ හෝ ඔහු විසින් කිසිවකු වැදුවේ හෝ නැත. තව ද ඔහු මෙන් කිසිවකු හෝ කිසිදෙයක් හෝ නොමැති ය."

(112:1-4)

අල්ලාහ්ට නැමදීම යනු සමහර ක්‍රියාවන්හි යෙදීම පමණක් නො වේ. ජීවිතය පුරා ම ඔහු කී ආකාරයට ඔහු අණ කළ දෑ පිළිපැද වැළැක්වූ දේවලින් වැළකී ජීවත් වීම ය. අල්ලාහ් මිනිසුන් යහමඟ යැවීම සඳහා මිනිසුන් අතරින් නබි මුහම්මද් සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා තෝරා ගත් බව අපි දනිමු. ඒ නිසා වක්තෘන් වූ එතුමා පෙන්වා දුන් මග අනුව අපගේ මුළු ජීවිතය ම සකස් කර ගත යුතු ය. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා අණ කළ දෑ පිළිගෙන කටයුතු කරන අතර එතුමන් වැළැක්වූ දේවලින් මුළුමනින් ම වැළකී කටයුතු කිරීම අපගේ යුතුකම වේ.

නබි තුමා මෙන් ම පෙර සිටි නබිවරු ද අල්ලාහ් පමණක් නමදින ලෙස ජනයාට දේශනා කළහ. අල්ලාහ් පමණක් නමදින ලෙස ජනයාට පැවසූ ආදම් අලයිහිස්සලාම්, නූහ් අලයිහිස්සලාම්, ඉබ්රාහීම් අලයිහිස්සලාම්, මූසා අලයිහිස්සලාම්, යන නබිවරුන්ගේ ඉතිහාසය අල් කුර්ආනයේ පැහැදිලි ව පෙන්වා දී ඇත.

"ඔබට පෙර අප යවා තැබූ දූතවරුන්ට සැබවින් මා හැර වෙනත් දූතයකු නැත. ඒ නිසා ඔබ මා නමදින්න" යැයි වහී දැනුම් දුන්නෙමු. (21 : 25)

නැමදීමට සුදුස්සා යන්නෙහි අර්ථය, උදවු පැතීමට සුදුස්සා ඔහු ය යන්න ය. ඔහු මිනිසුන්ගෙන් බොහෝ දුරින් නැත. තැරැවුකරුවන් මාර්ගයෙන් ඔහුට ළඟා වීම ද අවශ්‍ය නො වේ. ඔහු මිනිසුන්ට ඉතා ම සමීපයෙන් සිටී. මිනිසුන්ගේ අවශ්‍යතා ඉටුකර දෙන්නේ ද ඔහු ය. ඒ නිසා උදවු පැතිය යුත්තේ ඔහුගෙන් ම ය.

"අපි ඔබ ම නමදිමු; ඔබගෙන් ම උදවු පතමු." යැයි දිනපතා සලාතයේ දී පැවසීම පමණක් නො සෑහේ. අපගේ සියලු අවශ්‍යතා ඉදිරිපත් කළ යුත්තේ අල්ලාහ්ට ය. ඔහු මවකට වඩා තම ගැත්තන්ට කාරුණික ය. තුන් කල් දත් ඔහු තම ගැත්තන්ගේ අවශ්‍යතා ඉටු කරන්නේ ය. එසේ ඉටු නො කළ ද ඔහුගෙන් අප උදවු පැතීම නිසා ආනිශංස ලබා දෙන්නේ ය.

### අල්ලාහ්ගේ ගැත්තෙකු ලෙසින් ජීවත්වීමේ මාර්ග කිහිපයක්

1. අල්ලාහ් තමාට "මිනිසුන් යටහත් පහත් ව ක්‍රියා කළ යුතු" යන්න ප්‍රිය කරයි, යැයි දැනගන්න.
2. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ ජීවන ආදර්ශ තම ජීවිතයේ අනුගමනය කරන්න.
3. උඩඟුකම ඔබ විනාශ කරයි. එම නිසා එයින් සම්පූර්ණයෙන් මිදෙන්න.
4. සියල්ල අල්ලාහ් වෙත යොමු කරන්න. ඔහුගෙන් ම උදවු පතන්න.

## අභ්‍යාසය

1. අල්ලාහ්ගේ ගුණාංග පහක් සඳහන් කරන්න.
2. 'අප අල්ලාහ්ගෙන් උදවු පැතිය යුතු' ය යන්නට හේතු මොනවා ද?
3. 'අල්ලාහ් තුන් කල් ම දත් අයෙකි' යන්නෙන් ඔබ වටහා ගත්තේ කුමක් ද?
4. අල්ලාහ්ගේ ගැත්තෙකු වීමට නම් ආඩම්බරකම හා උඩඟුකම නොමැති විය යුතු ය, ඔබ මෙය පිළිගන්නෙහි ද? හේතු දක්වන්න.
5. 'නැමදුමට සුදුස්සා අල්ලාහ් පමණි' යන්නට අල් කුර්ආනයෙන් සාධක දෙකක් ඉදිරිපත් කරන්න.